**හලාවත නගර සභාව**

**පුත්තලම් දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 29 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකිරීම නිසා හිඟ මුද්දර ගාස්තු හා සමුච්චිත අරමුදල රු. 420,703 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා එකඟ නොවූ රු.1,500,075 ක වැටුප් ප්‍රතිපූර්ණයන් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් ණයගැතියන් සහ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් රු.1,500,075 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය වෙනුවෙන් ගෙවියයුතු ණය සඳහා වූ පොලිය රු.717,280 ක් ජංගම බැරකම් ලෙස ගිණුම්වල දක්වා නොතිබූ අතර, හිඟ පොලී වියදම ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 717,280 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 7ක ශේෂයන්හි වටිනාකම ඊට අදාල උපයෝගී ලේඛනයන්හි ශේෂයන් සමග නොසැසඳුන අතර, එම විෂයයන් 7හි නොසැසඳු වෙනසෙහි වටිනාකම රු.19,730,986 ක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පළාත් පාලන කොමසාරිස්ගෙන් අයවිය යුතුව තිබූ වර්ෂ කිහිපයක සිට පැවත එන හිඟ විනෝද බදු ප්‍රතිපූර්ණවල වටිනාකම රු. 501,257 ක්වූ අතර, 2014 දෙසැම්බර් 31 දිනට කාලවිශ්ලේෂණ පිළියෙල කර නොතිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,610,639 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 7 කට අදාලව වටිනාකම රු.98,065,809 ක් සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,368,525 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,186,075 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල පිළිවෙලින් රු.19,097,034 ක් හා රු.8,564,213 ක්වූ මූලධන ආධාර හා රු.32,619,424 ක් හා රු.32,840,143 ක්වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු පිළිවෙලින් රු.22,846,135 ක අතිරික්තයක් හා රු.3,089,855 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.25,935,990ක වර්ධනයක් සිදුව තිබුණි.

**2.2** **ආදායම් පරිපාලනය**

-------------------------

2.2.1 හිඟ ආදායම

----------------

(i) සභාපතිවරයා විසින් විගණනයට ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාල හිඟ ආදායම් පිළිබඳ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු රු.මි. 277.5 ක්ද, බදුකුලි රු.මි. 67.2 ක්ද, වෙනත් ආදායම් රු.මි.22.9 ක්ද වශයෙන් එකතුව රු.මි. 367.6 ක හිඟ ආදායම් පැවති බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනයන්හි ආදායම් විෂයන් 3 කට අදාලව රැස්කල යුතු ආදායම රු.60,432,641 ක් වූ අතර, වසර තුල රැස්කල ආදායම රු.22,319,136 ක් විය. ඒ අනුව ආදායම් විෂයන්ගේ හිඟ ආදායම් හා බිල්කල ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සියයට 32 සිට සියයට 67 දක්වා වූ පරාසයක පැවතුණි.

2.2.2 දැන්වීම් පුවරු ගාස්තු

--------------------------

නගර සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති ස්ථිර දැන්වීම් පුවරු සඳහා අයකරගත යුතු ප්‍රදර්ශන ගාස්තු වෙනුවෙන්, අතුරු ව්‍යවස්ථා පනවා එම ආදායම් රැස්කිරීම නිත්‍යානුකූල කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 දේපල බදු

-------------

දේපල බදුදීමේදී හලාවත නගර සභාව පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකර නොතිබුණි.

(i) ගිවිසුම් ප්‍රකාර නිශ්චිත කාලාන්තරයකට වරක් බදුකුලී සංශෝධනය කිරීම.

(ii) ඉඩම් බදුදීමේදී සහ ගිවිසුම්වලට එළඹීමේදී පළාත් ඉඩම් කොමසාරිස්ගේ හා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීම.

(iii) තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු මත පදනම්ව බදුකුලිය තීරණය කිරීම.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

"සණ අපද්‍රව්‍ය කළමනාකරණය" සම්බන්ධයෙන් 2010 වර්ෂයේ සිට ව්‍යාපෘති වාර්තා හා සැලසුම් සකස් කරමින් පැවතියද සමාලෝචිත වර්ෂය තුලදී ද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය තුල මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.29,612,363 ක් වෙනුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණ ද, එම වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය